සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2023 (2024)

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

I පත්‍රය - ලකුණු 1 × 40 = මුළු ලකුණු 40

II පත්‍රය - ප්‍රශ්න අංකය 01 අනිවාර්ය ප්‍රශ්නයකි.

ලකුණු 20 යි

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

ප්‍රශ්න අංක 2	-	ලකුණු	08	(ඕනෑම ප්‍රශ්න 02 කට) ලකුණු 2 x 8 = 16 යි
ප්‍රශ්න අංක 3	-	ලකුණු	08	
ප්‍රශ්න අංක 4	-	ලකුණු	08	

II කොටස - ගිණුම්කරණය

ප්‍රශ්න අංක 5	-	ලකුණු	12	(ඕනෑම ප්‍රශ්න 2කට) ලකුණු 2 x 12 = 24 යි
ප්‍රශ්න අංක 6	-	ලකුණු	12	
ප්‍රශ්න අංක 7	-	ලකුණු	12	

මුළු ලකුණු 60 යි

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රයට මුළු ලකුණු	=	40
II පත්‍රයට මුළු ලකුණු	=	60
අවසාන ලකුණු	=	100

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

රහස්‍යයි

විෂය අංකය / பாட இலக்கம் **60**

විෂයය / பாடம் **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	4	11.	2	21.	3	31.	1
02.	4	12.	1	22.	2	32.	2
03.	1	13.	1	23.	2	33.	1
04.	4	14.	3	24.	1	34.	4
05.	3	15.	3	25.	3	35.	4
06.	1	16.	3	26.	2	36.	4
07.	2	17.	1	27.	3	37.	3
08.	2	18.	3	28.	1	38.	2
09.	1	19.	4	29.	2	39.	2
10.	3	20.	1	30.	3	40.	2

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

60- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II පත්‍රය

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාරම්පරික වෙද පවුලකින් පැවත එන අමිල, ගිරන්කුල ග්‍රාමයෙහි ආයුර්වේද වෛද්‍යවරයෙකි. ඔහු තම පියා විසින් ලබා දුන් රු. 500 000 ක් වටිනා ගොඩනැගිල්ලෙහි අක්ෂි රෝග සඳහා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සකස් කර, විකිණීමේ ව්‍යාපාරයක් රු. 800 000 ක් මුදලින් යොදා 2024.01.01 දින 'ආයුරා' නමින් ආරම්භ කරන ලදී. එදින ම ඔහු රු. 400 000 ක යන්ත්‍ර හා උපකරණ මිල දී ගත්තේ ය. 'ආයුරා' නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සමහරක් ගිරන්කුල ග්‍රාමයෙන් මිල දී ගනියි. අමුද්‍රව්‍යවල ගුණත්වය ආරක්ෂා වන පරිදි හිරු එළියේ වේලා ඒවා ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගනියි.

2024.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

	රු.
අමුද්‍රව්‍ය මිල දී ගැනුම්	350 000
දුරකථන වියදම්	5 000
වැටුප් - නිෂ්පාදන සේවක	45 000
විකුණුම් සේවක	60 000
අනෙකුත් නිෂ්පාදන වියදම්	30 000
ප්‍රචාරණ වියදම්	15 000
බෙදාහැරීමේ රථ කුලී	150 000
ණයට විකුණුම්	900 000

අමතර තොරතුරු:

- 2024.01.31 දිනට අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ තොග කිසිවක් නොමැත.
- යන්ත්‍ර හා උපකරණ වාර්ෂිකව 6% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
- 2024.01.31 දිනට මාසික විදුලිබිල රු. 10 000 ක් ගෙවා නොමැත.

දුරකථනය, ෆැක්ස් පණිවුඩ හා විද්‍යුත් තැපැල මගින් ලබා ගන්නා දේශීය පාරිභෝගිකයින්ගේ ඇණවුම් බෙදාහැරීම ව්‍යාපාරය විසින් සිදු කරනු ලබයි. විදේශීය පාරිභෝගිකයින්ගෙන් මාර්ගගත ඇණවුම් ලබා ගැනීම සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කරමින් පවතින අතර ව්‍යාපාරයට සෘජු මාර්ගගත ගෙවීම් කවුළුවක් ලබා ගැනීමට තීරණය කර ඇත.

(i) (අ) 'ආයුරා' ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) 'ආයුරා' ව්‍යාපාරය අරමුණ අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) (අ) 'ආයුරා' ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) විද්‍යුත් ලිඛිත සන්නිවේදන මාධ්‍යය සඳහා ඉහත සිද්ධියේ ඇතුළත් සන්නිවේදන ක්‍රම දෙකක් ලියන්න.

1. (i) (අ) සෞඛ්‍ය *(ලකුණු 01යි)*

(ආ)
- ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර
- ලාභ අරමුණු කර ගත් කේවල ස්වාමි ව්‍යාපාර

(ලකුණු 01යි)

(ii) (අ) ශක්තීන් -
- අමිල පාරම්පරික වෙද පවුලකින් පැවත ඒම
- අමිල ආයුර්වේද වෛද්‍යවරයෙකු වීම
- ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් තිබීම
- පියාගෙන් ලද ගොඩනැගිල්ලක් තිබීම

(එක් කරුණකට ලකුණු ½යි)

අවස්ථා -
- ගිරන්කුල ග්‍රාමයෙන් අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම
- දේශීය පාරිභෝගිකයින් සිටීම
- විදේශීය පාරිභෝගිකයින් සිටීම
- ගිරන්කුල ග්‍රාමය හොඳින් හිරු එළිය ලැබෙන ප්‍රදේශයක් වීම
- ගිරන්කුල ප්‍රදේශයේ නව තාක්ෂණික යටිතල පහසුකම් පැවතීම.

(එක් කරුණකට ලකුණු ½ යි)

(ආ)
- ෆැක්ස් පණිවිඩ
- විද්‍යුත් තැපෑල
- වෙබ් පිටුව

(ලකුණු ½ x 2 = ලකුණු 01යි)

(iii) (අ) ශ්‍රමය

(ආ) ප්‍රාග්ධනය

(ඉ) භූමිය

(ඊ) ව්‍යවසායකත්වය

(ලකුණු ½ x 4 = ලකුණු 02යි)

(iv) (අ) සැලසුම්කරණය

- ව්‍යාපාරයට සෘජු මාර්ගගත ගෙවීම් කවුළුවක් ලබා ගැනීමට තීරණය කිරීම

(ලකුණු ½යි)

සංවිධානකරණය
- යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම
- අමුද්‍රව්‍ය මිල දී ගැනීම
- සේවකයින් බඳවා ගැනීම
- ව්‍යාපාරයට ප්‍රාග්ධනය යෙදවීම
- ව්‍යාපාරයට ගොඩනැගිල්ල යෙදවීම

(එක් කරුණකට ලකුණු ½ යි)

(ආ) ස්ථානය/ බෙදාහැරීම

(ලකුණු 01යි)

(v)

වත්කම් (රු.)	=	හිමිකම් (රු.)	+	වගකීම් (රු.)
1 300 000	=	1 300 000	+	-

(ලකුණු 02යි)

හෝ

වත්කම් (රු.)	=	හිමිකම් (රු.)
1 300 000	=	1 300 000

හෝ

	වත්කම් (රු.)	=	හිමිකම් (රු.)	+	වගකීම් (රු.)	
•	+ 500 000 (ගොඩනැගිලි)	=	+500 000	+	-	ලකුණු ½
•	+ 800 000 (මුදල්)	=	+800 000	+	-	ලකුණු ½
•	- 400 000 (මුදල්)	=	-	+	-	ලකුණු ½
	+ 400 000 (යන්ත්‍ර හා උපකරණ)			+	-	
	1 300 000		1 300 000			

(vi) (අ) විකුණුම් ඉන්වොයිසිය *(ලකුණු 01 යි)*

(ආ) විකුණුම් ජර්නලය *(ලකුණු 01 යි)*

(vii) (අ) රු. 2 000 *(ලකුණු 01යි)*

පෙරවැඩ

$$400\,000 \times \frac{6}{100} \times \frac{1}{12}$$

(ලකුණු ½)

(ආ) යන්ත්‍ර හා උපකරණ ක්ෂය ගිණුම හර රු. 2 000
යන්ත්‍ර හා උපකරණ ක්ෂය වෙන් කිරීම් ගිණුම/ බැර රු. 2 000
සමුච්චිත ක්ෂය ගිණුම *(ලකුණු 01යි)*

(viii) (අ) අමුද්‍රව්‍ය මිලදී ගැනුම් රු. 350 000
නිෂ්පාදක සේවක වැටුප් රු. 45 000

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

(ආ) විකුණුම් සේවක වැටුප් රු. 60 000
ප්‍රචාරණ වියදම රු. 15 000
බෙදාහැරීමේ රථ කුලී රු. 150 000

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

(ix) ශුද්ධ ලාභය = රු. 233 000 ***(ලකුණු 02යි)***

පෙර වැඩ

<u>ආදායම්</u>		රු.
විකුණුම්		900 000 (½)
<u>වියදම්</u>		
අමුද්‍රව්‍ය මිලදී ගැනුම්	රු. 350 000*	
දුරකථන වියදම්	රු. 5 000*	
නිෂ්පාදන සේවක වැටුප්	රු. 45 000*	
විකුණුම් සේවක වැටුප්	රු. 60 000*	
අනිකුත් නිෂ්පාදන වියදම්	රු. 30 000*	
ප්‍රචාරණ වියදම්	රු. 15 000*	
බෙදා හැරීමේ රථ කුලී	රු. 150 000*	
යන්ත්‍ර හා උපකරණ ක්ෂය (½)	රු. 2 000	
විදුලි බිල	රු. 10 000 (½)	
		667 000
ශුද්ධ ලාභය	රු.	233 000

(* අයිතම 04 ක් සඳහා ½යි)

(x) (අ) රු. 898 000 ***(ලකුණු 01යි)***

හෝ

ගොඩනැගිල්ල	රු. 500 000	***(ලකුණු ½යි)***
යන්ත්‍ර හා උපකරණ	රු. 398 000	***(ලකුණු ½යි)***

(ආ) රු. 1 533 000 *(ලකුණු 01යි)*

හෝ

ප්‍රාග්ධනය	1 300 000
+ලාභය	(½) 233 000
	1 533 000

	(i)		(ii)		(iii)				(iv)		(v)	(vi)		(vii)		(viii)		(ix)	(x)		20/20
01	(අ)	(ආ)	(අ)	(ආ)	(අ)	(ආ)	ඉ	ඊ	(අ)	(ආ)		(අ)	(ආ)	(අ)	(ආ)	(අ)	(ආ)		(අ)	(ආ)	
	01	01	01	01	½	½	½	½	01	01	02	01	01	01	01	01	01	02	01	01	

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) තේවල ස්වාමී ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර සංවිධාන අයිතිය අනුව පෞද්ගලික හා පොදු අංශ ලෙස වර්ග කෙරේ.

(ආ) අභ්‍යන්තර පරිසර සාධක අධ්‍යයනය තුළින් ව්‍යාපාර අවස්ථා හා ශක්තීන් හඳුනා ගැනේ.

(ඉ) ව්‍යාපාර ගොඩනැගිල්ල පිහිටි ඉඩම සැම විට ම නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.

(ඊ) ව්‍යාපාරයක අයිතිකරු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් වුව ද අසීමිත වගකීමකට යටත් වේ. (ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ ව්‍යාපාර වර්ග දෙකකි.

A – කොළඹ ජාතික රෝහල

B – සුමඟ රියදුරු පාසල

(අ) ඉහත A හා B සපුරාලන මිනිස් අවශ්‍යතා මොනවා ද?

(ආ) ඉහත A හා B ව්‍යාපාර නිෂ්පාදිතයේ ස්වභාවය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 02 යි)

(iv) මහා පරිමාණ සුපිරි වෙළෙඳසැල් ජාලයක් හිමි අරවින්ද ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන, වට්ටම් තීරණය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය හා රෝබෝවරුන් යොදා ගැනීමට තීරණය කර ඇත.

(අ) ඉහත සිද්ධියේ සුපිරි වෙළෙඳසැල අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් තාක්ෂණික පරිසර සාධකයක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

(i)

- ප්‍රාග්ධනය අයිතිකරු වන තනි පුද්ගලයකු විසින් යෙදවීම
- ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම
- අයිතිකරුගේ වගකීම අසීමිත වීම
- නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම
- තනිව තීරණ ගත හැකි වීම
- පාලනය අයිතිකරු විසින් සිදු කිරීම
- ඕනෑම විටක දී අයිතිකරුගේ කැමැත්ත පරිදි ව්‍යාපාරය අවසන් කළ හැකි වීම
- බලපවත්වන නීති රීති අවම වීම

(ලකුණු 01 × 2 = ලකුණු 02යි)

(ii) (අ) සත්‍යයි
(ආ) අසත්‍යයි
(ඉ) අසත්‍යයි
(ඊ) අසත්‍යයි (ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iii)　(අ)　A - සෞඛ්‍යය

B - අධ්‍යාපනය　　　　**(ලකුණු ½ × 2 = ලකුණු 01යි)**

(ආ)　A - සේවා සැපයීමේ ව්‍යාපාර

B - සේවා සැපයීමේ ව්‍යාපාර

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

(iv)　(අ)　ලාභ අරමුණු කරගත් ව්‍යාපාර/ පෞද්ගලික අංශයේ ව්‍යාපාර/ මහා පරිමාණ ව්‍යාපාර/ කේවල ස්වාමි ව්‍යාපාර

(ලකුණු 01යි)

(ආ)
- කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම
- රොබෝවරුන් යොදා ගැනීම

(ලකුණු 01යි)

02	(i)	(ii)				(iii)		(iv)		08/08
		අ	ආ	ඉ	ඊ	අ	ආ	අ	ආ	
	02	½	½	½	½	01	01	01	01	

3. (i) දේපළ රක්ෂණය හා ජීවිත රක්ෂණය අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට වාණිජ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක් තිබීම අවශ්‍ය වේ.

(ආ) විද්‍යුත් තැපෑල, ව්‍යාපාරයක අභ්‍යන්තර මෙන්ම බාහිර සන්නිවේදන ක්‍රමයකි.

(ඉ) හානිපූරණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ නොවේ.

(ඊ) යාපනය දුම්රිය ස්ථානය ප්‍රවාහන මූලිකාංගයක් වන පර්යන්තයට නිදසුනකි. (ලකුණු 02 යි)

(iii) ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අමර, මිලදී ගත් අමුද්‍රව්‍ය සඳහා සරත්ට රු. 100 000 ක චෙක්පතක් නිකුත් කරන ලදී. අමර තම ජංගම ගිණුම මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අතර, සරත් ලංකා බැංකුවේ පවත්වා ගෙන යයි.

(අ) ඉහත සිද්ධියෙහි ඇතුළත් චෙක්පතෙහි අණලද්දා හා අණකරු නම් කරන්න.

(ආ) අමරගෙන් ලද චෙක්පත සම්බන්ධයෙන් සරත්ට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක කළමනාකරු වන දීපාල්ට, ගනුදෙනුකරුවෙකු විසින් බෑග් 50 ක් අවශ්‍ය බව දුරකථනයෙන් දැනුම් දුන්නේ ය. දීපාල් ඇණවුම භාර ගෙන දින දෙකක් ඇතුළත බෑග් සපයන බවට සහතික විය. ඉහත සිද්ධියට අදාළ සන්නිවේදන ක්‍රියාවලියේ එක් එක් සන්නිවේදන මූලිකාංගය සඳහා නිදසුන් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

(i)

ජීවිත රක්ෂණය	දේපළ රක්ෂණය
• රක්ෂණ ඔප්පුවේ වටිනාකම ජීවිත අවදානම හා රක්ෂිතයාගේ ගෙවීමේ හැකියාව මත තීරණය වේ.	• රක්ෂණ ඔප්පුවේ වටිනාකම අදාළ දේපලවල මූල්‍යමය වටිනාකම අනුව තීරණය වේ.
• හානි පූරණ මූලධර්මය බලනොපායි.	• හානි පූරණ මූලධර්මය බලපායි.
• රක්ෂණය කරන ලද මුදලට අමතරව ප්‍රසාද දීමනා, පොලි වැනි ප්‍රතිලාභ හිමි වේ.	• වෙනත් අමතර ප්‍රතිලාභ හිමි නොවේ.
• දිගු කාලීනයි	• කෙටි කාලීනයි
• අවදානම නිශ්චිත වේ.	• අවදානම නිශ්චිත නොවේ.
• රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි ය.	• රක්ෂණ ඔප්පුව පැවරිය හැකි ය.

(එක් වෙනස්කමකට ලකුණු 01 x 2 = ලකුණු 02යි)

(ii) (අ) අසත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) සත්‍යයි

(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)

(iii) (අ) අණලද්දා - මහජන බැංකුව

අණකරු - අමර

(ලකුණු ½ x 2 = ලකුණු 01යි)

(ආ)
- සරත්ට චෙක්පත බැංකුගත කළ හැකි ය.
- චෙක්පත අන්අයෙකුට පැවරිය හැකි ය.
- මහජන බැංකු කවුන්ටරයකින් මුදල් කර ගත හැකි ය.

(½ x 2 = ලකුණු 01යි)

(iv)

මූලිකාංගය		**නිදසුන**
යවන්නා	-	ගනුදෙනුකරු
පණිවුඩය	-	බෑග් 50 ක් අවශ්‍යය
මාධ්‍යය	-	විද්‍යුත් වාචික/ විද්‍යුත්/ වාචික
ලබන්නා	-	දීපාල්/ කළමණාකරු
ප්‍රතිචාරය	-	ඇණවුම භාර ගැනීම
ප්‍රතිපෝෂණය	-	දින 02 ක් ඇතුළත බෑග් සපයන බව සහතික වීම

(ලකුණු ½ × 4 = ලකුණු 02 යි)

03	(i)	(ii)				(iii)		(iv)	08/08
		අ	ආ	ඉ	ඊ	අ	ආ		
	02	½	½	½	½	01	01	02	

4. (i) 'ඉලක්ක වෙළෙඳපොළක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ඉහළ ප්‍රතිලාභයක් අපේක්ෂිත ආයෝජනවල ඉහළ අවදානමක් ගම්‍ය වේ.

(ආ) ව්‍යාපාර ආයතනයක් විසින් ලබා දෙන වට්ටම් අලෙවිකරණ මිශ්‍රයේ මිල විචල්‍යයට අයත් වේ.

(ඉ) කළමනාකරණ ක්‍රියාවලියේ පළමු කාර්යය සංවිධානකරණයයි.

(ඊ) රජයට අවශ්‍ය දිගුකාලීන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි. (ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ අලෙවි කළමනාකරුවෙකු විසින් හඳුන්වා දීමට යෝජිත උණුසුම රඳවන වතුර බෝතලයක් පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A – බෝතලයේ උස 15 cm වන අතර, කොළ පැහැය සහිත වේ.

B – මූලික හඳුන්වාදීම සාසල් අසල සිදු කරයි.

C – පිරිවැයට 10% ක ලාභාන්තිකයක් සහිතව මිල කරයි.

D – ප්‍රචාරණය රූපවාහිනිය මගින් සිදු කරයි.

ඉහත **A, B, C** හා **D** යන එක් එක් ප්‍රකාශවල ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය ලියන්න. (ලකුණු 02 යි)

(iv) රුවිනි තම ඉතිරිකරගත් මුදල් පහත දැක්වෙන ආයෝජනවල ආයෝජනය කිරීමට අදහස් කරයි.

A – කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල

B – රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක

C – රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ තැන්පතුවක

D – ස්වර්ණාභරණ මිල දී ගැනීමට

(අ) රුවිනි ප්‍රාග්ධන ලාභ ලැබීමට අදහස් කරයි නම් ඔබ නිර්දේශ කරන ආයෝජනය කුමක් ද?

(ආ) රුවිනි ස්ථාවර මාසික පොලියක් ලැබීමට අදහස් කරයි නම්, ඔබ නිර්දේශ කරන ආයෝජනය කුමක් ද? (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

(i) ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන් ම ලාභදායී ව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයින්ගෙන් සමන්විත වෙළෙඳ පොළ කොටස හෙවත් පාරිභෝගික කොටසයි.

(ලකුණු 02යි)

(ii) (අ) සත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) අසත්‍යයි

(ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iii) A - නිෂ්පාදිතය

B - ස්ථානය/ ප්‍රවර්ධනය

C - මිල

D - ප්‍රවර්ධනය

(ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iv) (අ)
- A
- D

(ලකුණු 01 × 1 = ලකුණු 01යි)

(ආ) B

(ලකුණු 01යි)

04	(i)	(ii)				(iii)	(iv)		08/08
		අ	ආ	ඉ	ඊ		අ	ආ	
	02	½	½	½	½	02	01	01	

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) 'ගිණුම්කරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් එක් එක් ගිණුම අයත්වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

(අ) ණයගැති ගිණුම (ආ) ගැනිලි ගිණුම

(ඉ) විකුණුම් ගිණුම (ඊ) බැංකු ණය ගිණුම (ලකුණු 02 යි)

(iii) (අ) 2024.01.01 දින සහන් රු. 100 000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මෙම ගනුදෙනුවෙන් පසු සහන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය ලියන්න.

(ආ) ඉහත (iii) (අ) හි සඳහන් සහන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය එක් ගනුදෙනුවකින් පසු පහත දැක්වෙන පරිදි විය.

වත්කම් = හිමිකම් + වගකීම්

රු. 200 000 රු. 100 000 රු. 100 000

එම ගනුදෙනුවෙන් මුදල් වත්කම් රු. 100 000 කින් වැඩි විය. සිදු වී ඇති ගනුදෙනුව ලියන්න.

(ඉ) පුබුදුගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
2. රු. 20 000 ක් ණයගැතියෙකුගෙන් ලැබීම
3. රු. 35 000 ක් වූ බඩු තොගයක් රු. 50 000 කට ණයට විකිණීම

ඉහත එක් එක් ගනුදෙනුව පුබුදුගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමට පහත දැක්වෙන පරිදි ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුවේ බලපෑම දී ඇත.)

ගනුදෙනු අංකය	වත්කම්	හිමිකම්	වගකීම්
1	වැඩිවේ	–	වැඩිවේ
2			
3			

(ලකුණු 04 යි)

(iv) 2024.03.01 දිනට සුරන්ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ ශේෂය රු. 15 800 ක් විය. 2024 මාර්තු මාසයේ මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු පහත දී ඇත.

දිනය	ලදුපත් අංකය	වවුචර් අංකය	විස්තරය
2024.03.05	15	-	රු. 35 000 කට භාණ්ඩ අත්පිට විකිණීම
2024.03.10	-	24	රු. 60 000 ක ළී බඩු මිල දී ගැනීම
2024.03.17	16	-	ණයගැතියකුගෙන් රු. 45 000 ක් ලැබීම
2024.03.29	-	25	රු. 15 000 ක විදුලි බිල ගෙවීම

අවශ්‍ය වන්නේ :

සුරන්ගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර 2024.03.31 දිනට මුදල් ශේෂය දැක්වීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

(i) ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය ලෙස හැඳින්වේ.

(ලකුණු 02යි)

(ii) (අ) - වත්කම්

(ආ) - හිමිකම්

(ඉ) - ආදායම්

(ඊ) - වගකීම්

(ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iii) (අ) වත්කම් = හිමිකම්

රු. 100 000 = රු. 100 000

(ලකුණු 01යි)

(ආ) ණය මුදලක් ලබා ගැනීම රු. 100 000

(ලකුණු 01යි)

(ඉ)

ගනුදෙනු අංකය	වත්කම්	හිමිකම්	වගකීම්	
2	වැඩි වේ අඩු වේ	-		01
3	වැඩි වේ අඩු වේ	වැඩි වේ		01

(ලකුණු 02යි)

(iv)

මුදල් පොත ½

දිනය	ල. අ	විස්තරය	ස. පි	වටිනාකම රු.	දිනය	ව. අ	විස්තරය	ස.පි	වටිනාකම රු.
2024					2024				
03.01		ශේෂය ඉ/ගෙ		15 800 ½	03.10	24	ලී බඩු ගිණුම		60 000 ½
03.05	15	විකුණුම් ගිණුම		35 000 ½	03.29	25	විදුලි වියදම් ගිණුම		15 000 ½
03.17	16	ණයගැති ගිණුම		45 000 ½	03.31		ශේෂය/ප/ගෙ		20 800 01
				95 800					95 800
04.01		ශේෂය/ඉ/ගෙ		20 800					

(ලකුණු 04යි)

05	(i)	(ii)				(iii)			(iv)	
		(අ)	(ආ)	(ඉ)	(ඊ)	අ	ආ	ඉ		12
	02	1/2	1/2	1/2	1/2	01	01	02	04	12

6. (i) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂ අසමානවීමට බලපෑ හේතු දෙකක් පහත දැක්වේ.
   1. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්
   2. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

ඉහත සඳහන් එක් එක් හේතුව නිසා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය අඩු වේ ද, වැඩි වේ ද යන්න සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් එක් එක් නිෂ්පාදිතයට අදාළ පිරිවැය වර්ගය සඳහා නිදසුනක් බැගින් ලියන්න.

අංකය	නිෂ්පාදිතය	පිරිවැය වර්ගය	නිදසුන
1	පාන්	සෘජු ද්‍රව්‍ය පිරිවැය	………………………
2	පාසල් නිල ඇඳුම්	සෘජු ශ්‍රම පිරිවැය	………………………

(ලකුණු 02 යි)

(iii) නිමන්තිගේ පාපිස්නා මැසීමේ ව්‍යාපාරයේ 2024 අප්‍රේල් මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

	රු.
රෙදි කැබලි මිලට ගැනීම ………………………………	60 000
රෙදි මැසීමේ යන්ත්‍රයක් ණයට ගැනීම ………………………	120 000
(මෙය වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරයි)	
නූල්, ඉඳිකටු හා වෙනත් අවශ්‍ය දෑ ගැනීම ………………………	2 000
පාපිසි මසන්නාට වැටුප් ගෙවීම ………………………	40 000
මසන ස්ථානය පිරිසිදු කරන්නාට වැටුප් ගෙවීම ………………	10 000
අප්‍රේල් මාසයේ විදුලිබිල ගෙවීම ………………………	5 000
ව්‍යාපාර ස්ථානයේ මාසික කුලිය ගෙවීම ………………………	8 000

- එක් පාපිස්නාවක නිෂ්පාදන පිරිවැය රු. 126 කි.

අවශ්‍ය වන්නේ :

(අ) 2024 අප්‍රේල් මාසයේ නිෂ්පාදන පිරිවැය ලේඛනය

(ආ) 2024 අප්‍රේල් මාසයේ නිෂ්පාදනය කළ පාපිසි සංඛ්‍යාව (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාරයක ආධුනික ගිණුම් ලිපිකරු විසින් 2024.03.31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් විස්තරය පහත දැක්වේ.

බැංකු සැසඳුම් විස්තරය

	රු.	රු.
2024.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය		33 000
එකතු කළා : ණයගැති සෘජු ප්‍රේෂණ	13 000	
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්	24 000	37 000
		70 000
අඩු කළා : බැංකු ණය වාරිකය	5 000	
චෙක්පොත් ගාස්තුව	1 000	
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්	15 000	(21 000)
බැංකු ප්‍රකාශනයේ ශේෂය		49 000

අවශ්‍ය වන්නේ :

(අ) 2024.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2024.03.31 දිනට නිවැරදි බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

(i) (1) අඩු වේ.

(2) වැඩි වේ. ***(ලකුණු 01 × 2 = ලකුණු 02යි)***

(ii) (1) පිටි

(2) ඇඳුම් මසන්නාගේ වැටුප ***(ලකුණු 01 × 2 = ලකුණු 02යි)***

(iii) (අ)

නිමන්තිගේ ව්‍යාපාරයේ 2024 අප්‍රේල් මාසය සඳහා

නිෂ්පාදන පිරිවැය ලේඛනය

පිරිවැය අයිතමය	රු.	රු.
ප්‍රාථමික පිරිවැය		
සෘජු ද්‍රව්‍ය - රෙදිකැබලි	60 000	(½)
සෘජු ශ්‍රමය - මසන්නාගේ වැටුප	40 000	(½)
ප්‍රාථමික පිරිවැය		100 000
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය		
වක්‍ර ද්‍රව්‍ය - නූල්, ඉඳිකටු හා වෙනත් දෑ	2 000*	
වක්‍ර ශ්‍රමය - පිරිසිදු කරන්නාගේ වැටුප	10 000*	
වක්‍ර වෙනත් - විදුලි බිල	5 000*	
ස්ථානයේ කුලිය	8 000*	
යන්ත්‍ර ක්ෂය	1 000 (½)	
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය		26 000
මුළු නිෂ්පාදන පිරිවැය (½)		126 000 (½)

* අයිතම 3 ක් සඳහා ලකුණු ½යි

(ලකුණු 03යි)

(ආ) නිෂ්පාදනය කළ පාපිසි සංඛ්‍යාව = 1 000 ***(ලකුණු 01යි)***

පෙරවැඩ

(½) $\left\{ \dfrac{126\,000}{126} \right.$

(iv) (අ)

2024 මාර්තු 31 දිනට

බැංකු ගිණුම

දිනය	විස්තරය	ස. පි.	වටිනාකම රු.	දිනය	විස්තරය	ස. පි	වටිනාකම රු.
24.03.31	ශේෂය ඉ/ගෙ		33 000 (½)		ණය වාරිකය		5 000 (½)
	ණයගැති ප්‍රේෂණ		13 000 (½)		චෙක්පොත් ගාස්තු		1 000 (½)
				24.03.31	ශේෂය ප/ගෙ		40 000
			46 000				46 000
24.04.01	ශේෂය ඉ/ගෙ		40 000				

(ලකුණු 02යි)

(ආ)

2024 මාර්තු 31 දිනට

බැංකු සැසඳුම් විස්තරය

	රු.	රු.
බැංකු ගිණුමේ (සංශෝධිත) ශේෂය		(½) 40 000
එකතු කළා :-		
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත්	15 000	15 000 (½)
		55 000
අඩු කළා :-		
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්	24 000	(24 000) (½)
2024.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය		31 000 (½)

(ලකුණු 02යි)

	(i)		(ii)		(iii)		(iv)		
06	01	02	01	02	අ	ආ	අ	ආ	12/12
	01	01	01	01	03	01	02	02	

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ලැබීම් හා ගෙවීම් ගිණුමේ බැරට සටහන් කරන එහෙත් ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් නොකරන අයිතම දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ගිණුම් පොත්වලින් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

වර්ෂය තුළ ලැබීම්	වර්ෂය තුළ ගෙවීම්
සාමාජික මුදල් රු. 30 000	ක්‍රීඩාගාරය නඩත්තු වියදම් රු. 12 000
පරිත්‍යාග රු. 10 000	විදුලිය ගාස්තු රු. 8 000

අතිරේක තොරතුරු :

- 2023.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු. 2 000 කි.
- 2023.12.31 දිනට උපචිත විදුලි ගාස්තු රු. 6 000 කි.

අවශ්‍ය වන්නේ :

දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කළ යුතු අයිතම **හතරක්** වටිනාකම් සහිතව ලියන්න. (ලකුණු 02 යි)

(iii) දුමින්දගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ගැනුම්	380 000	
විකුණුම්		550 000
2023.01.01 දිනට තොගය	80 000	
ගෙනඒමේ කුලී	10 000	
ණයගැතියෝ	190 000	
ණයහිමියෝ		244 000
10% බැංකු ණය		100 000
ගෙවූ ණය පොලී	6 000	
බෙදාහැරීමේ රථ (පිරිවැයට)	400 000	
බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2023.01.01 දිනට)		40 000
ලී බඩු හා උපකරණ (පිරිවැයට)	120 000	
විදුලි ගාස්තු	60 000	
ප්‍රචාරණ වියදම්	44 000	
මුදල් ශේෂය	44 000	
ප්‍රාග්ධනය		400 000
	1 334 000	1 334 000

අතිරේක තොරතුරු :

- 2023.12.31 දිනට තොගය රු. 88 000 කි.
- බෙදාහැරීමේ රථ වාර්ෂිකව 5% බැගින් ද, ලී බඩු හා උපකරණ වාර්ෂිකව 10% බැගින් ද, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ :

(අ) දුමින්දගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2023.12.31 දිනට දුමින්දගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

(i)
- ජංගම නොවන වත්කම් මිල දී ගැනීම
- ණය හිමියන්ට මුදල් ගෙවීම
- පොලී රහිත බැංකු ණය ගෙවීම
- ආයෝජනවල මුදල් යෙදවීම
- ස්ථාවර තැන්පතුවල මුදල් යෙදවීම

(ලකුණු 01 × 2 = ලකුණු 02යි)

(ii) • සාමාජික මුදල් රු. 32 000
• පරිත්‍යාග රු. 10 000
• විදුලි ගාස්තු රු. 14 000
• ක්‍රීඩාගාර නඩත්තු වියදම් රු. 12 000

(ලකුණු ½ x 4 = ලකුණු 02යි)

(iii)

(අ)

දුමින්ද ව්‍යාපාරය

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභ ප්‍රකාශනය (½)

	රු.	රු.		රු.	රු.
2023.01.01 තොගය		80 000	විකුණුම්		550 000
එකතු කළා :-ගැනුම්	380 000				
ගෙනප්මේ කුලී	10 000	390 000			
විකිණීමට ඇති තොගයේ පිරිවැය		470 000			
අඩු කළා : 2023.12.31 තොගය		(88 000) (½)			
විකුණුම් පිරිවැය		382 000 (½)			
දළ ලාභය ප/ගෙ		168 000 (½)			
		550 000			550 000
			දළ ලාභය ඉ/ගෙ		168 000
බෙදාහැරීම් වියදම්					
බෙදාහැරීමේ රථ ක්ෂය	20 000 (½)				
ප්‍රචාරණ වියදම්	44 000				
		64 000			
පරිපාලන වියදම්					
ලී බඩු හා උපකරණ ක්ෂය	12 000 (½)				
විදුලි ගාස්තු	60 000				
		72 000			
මූල්‍ය හා වෙනත් වියදම්					
බැංකු ණය පොලී	10 000 (½)				
		10 000			
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට බැර කළා		22 000 (½)			
		168 000			168 000

(ලකුණු 04යි)

(ආ)

දුමින්ද ව්‍යාපාරය
2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (½)

	රු.	රු.	**ජංගම නොවන වත්කම්**	පිරිවැය රු.	සමුච්චිත ක්ෂය රු.	ධාරණ අගය රු. (½)
ප්‍රාග්ධනය 2023.01.01	400 000		බෙදාහැරීමේ රථය	400 000	60 000 (½)	340 000
එකතු කළා - ශුද්ධ ලාභය (½)	22 000	422 000	ලී බඩු හා උපකරණ	120 000	12 000 (½)	108 000
				520 000	72 000	448 000
ජංගම නොවන වගකීම්						
10% බැංකු ණය		100 000 (½)	**ජංගම වත්කම්**			
ජංගම වගකීම්			තොගය		88 000	(½)
			ණයගැතියෝ		190 000	
ණයහිමියෝ	244 000		මුදල්		44 000	322 000
ගෙවිය යුතු ණයපොලි	4 000 (½)	248 000				
		770 000				770 000

(ලකුණු 04යි)

(iii) **විකල්ප පිළිතුර**

(අ)

දුමින්ද ව්‍යාපාරය
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශනය (½)

	රු.	රු.	රු.
විකුණුම්			550 000
අඩුකළා - විකුණුම් පිරිවැය :			
2023.01.01 දිනට තොගය		80 000	
එකතු කළා - ගැනුම්	380 000		
ගෙන ඒමේ කුලී	10 000	390 000	
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය		470 000	
අඩුකළා - 2023.12.31 දිනට තොගය		(88 000) (½)	
විකුණුම් පිරිවැය			(382 000) (½)
දළ ලාභය			168 000 (½)
අඩු කළා වියදම් :			
බෙදාහැරීමේ වියදම් :			
බෙදා හැරීමේ රථ ක්ෂය	20 000 (½)		
ප්‍රචාරණ වියදම්	44 000		
		64 000	
පරිපාලන වියදම් :			
ලී බඩු හා උපකරණ ක්ෂය	12 000 (½)		
විදුලි ගාස්තු	60 000		
		72 000	
මූල්‍ය හා වෙනත් වියදම් :			
බැංකු ණය පොළී	10 000 (½)	10 000	
			(146 000)
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා			22 000 (½)

(ලකුණු 04යි)

[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]

(ආ)

දුමින්ද ව්‍යාපාරය
2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (½)

	පිරිවැය රු.	සමුච්චිත ක්ෂය රු.	ධාරණ අගය රු.
ජංගම නොවන වත්කම් :			
බෙදා හැරීමේ රථ	400 000	60 000 (½)	340 000
ලී බඩු හා උපකරණ	120 000	12 000 (½)	108 000
	520 000	72 000	448 000
ජංගම වත්කම්			
තොගය		88 000 (½)	
ණයගැතියෝ		190 000	
මුදල්		44 000	322 000
මුළු වත්කම්			770 000
2023.01.01 ප්‍රාග්ධනය		400 000	
එකතු කළා - ශුද්ධ ලාභය		(½) 22 000	422 000
ජංගම නොවන වගකීම් :			
10% බැංකු ණය			100 000 (½)
ජංගම වගකීම්			
ණයහිමියෝ		244 000	
ගෙවිය යුතු ණය පොළී		4 000 (½)	
			248 000
මුළු හිමිකම් හා වගකීම්			770 000

(½) (column headings)

(ලකුණු 04යි)

07	(i)	(ii)	(iii) අ	(iii) ආ	
	02	02	04	04	12/12

****

WWW.PastPapers.WiKi

[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න